# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1953/7 – 2016 පෙබරවාරි 08 වැනි සඳුදා – 2016.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දැන්වීම්

### මාතර දිස්ත්‍රික්කයේ කොටවිල පිහිටි කනංකදෙනිය වත්ත නමැති රජයේ ඉඩමේ තිබෙන පොල් ඵලදාව නෙලා ගැනීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම

1. මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති කනංකදෙනියවත්ත නැමති රජයේ ඉඩමේ තිබෙන පොල් ඵලදාව 2016.03.11 දිනෙන් ඇරඹී 2017.03.10 දිනෙන් එක් අවුරුද්දක් අවසන් වන කාල පරිච්ඡේදය තුළ නෙලා ගැනීමේ අයිතිය මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් විසින් 2016.03.11 දින පෙ.ව. 10.00 ට අදාළ ඉඩමේ දී වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. පොල් ගස් 72ක් හා තැඹිලි ගස් 9ක් සඳහා ආරම්භක ලංසුව රු. 25,000/- කි. එම අවම ලංසුවට ඉල්ලීමක් පිළිගනු නොලැබේ.

3. කිසියම් ලංසුවක් පිළිගැනීමට පෙර එම ලංසුව තැබූ තැනැත්තා වෙන්දේසිය පිළිබඳව කොන්දේසි පිළිගැනීමට එකඟ විය යුතුය.

4. සෑම ලංසු තබන්නෙකුම තමාම පැමිණ වෙන්දේසියට පෙනී සිටිය යුතුය. පැමිණිය නොහැකි නම් නියෝජිතයකු එවිය හැකි අතර ඔහු විසින් බලය පැවරීමේ ලිපි පරීක්ෂා කිරීම සඳහා වෙන්දේසියට පෙර වැලිගම ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

5. පිළිගනු ලැබූ ලංසුකරුවන් විසින් තම ලංසුවෙන් හරි අඩක් වැලිගම ප්‍රාදේශීය ලේකම් වෙත එම අවස්ථාවේම ගෙවිය යුතුය. ඉතිරි කොටස වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ගෙවිය යුතුය. තෝරා ගනු ලැබූ ලංසුකරුට ඉඩමේ භුක්තිය භාරදෙනු ලබන්නේ ලංසුවේ මුළු මුදල ගෙවූ පසු පමණි. ලංසුව පිළිගනු ලැබූ වහාම එම ලංසුවෙන් හරි අඩක් ගෙවීමට හෝ වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ඉතිරි මුළු මුදල ගෙවීමට ලංසුකරු අසමත් වුවහොත් වෙන්දේසිය අවලංගු කොට යම් මුදලක් ගෙවා ඇතොත් රාජසන්තක කිරීමට ප්‍රාදේශීය ලේකම්ට අයිතිය තිබේ.

6. තෝරා ගනු ලැබූ ලංසුකර ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබූ යම් මුදලක් වෙතොත් ඇපයක් වශයෙන් තැන්පත් කළ යුතුය.

7. තෝරාගනු ලැබූ ලංසුකරුට පහත සඳහන් කොන්දේසි ඇතුළත් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(අ) බලපත්‍රලාභියාට ලිඛිත දැන්වීමක් මගින් මාසයක් කල් දී ප්‍රාදේශීය ලේකම් විසින් එම බලපත්‍රය ඕනෑම අවස්ථාවක දී අවසන් කළ හැකිය.

(ආ) ඉඩම සම්බන්ධව සියළු වරිපනම් හා අයබදු ද තක්සේරුව හා වියදම් ද බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතුය.

(ඇ) බලපත්‍රලාභියා තාවකාලික, ස්ථිර හෝ ගොඩනැගිලි නොහොත් ඉදිකිරීම් කිසිවක් නොකළ යුතුය.

(ඈ) බලපත්‍රලාභියා විසින් ඉඩමේ ඇති සියළු මායිම් ගල් මනා තත්ත්වයෙන් තබාගත යුතුය.

(ඉ) ඉඩමෙහි ඇති ගස් කොළන් කැපීම, ඉවත ගෙන යාම කවර ආකාරයකින් හෝ ඒවාට අලාභ හානි සිදු කිරීම නොකළ යුතුය.

(ඊ) මෙම ඉඩමෙන් පස්, වැලි හෝ බොරළු හෝ වෙනත් ද්‍රව්‍ය ඉවතට ගෙන යාම නොකළ යුතුය.

(උ) ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන මිස බලපත්‍රලාභියා විසින් තමාට ඇති අයිතිය පැවරීම, අතුරු බදු දීම, උකස් කිරීම, නැතහොත් වෙනත් ආකාරයකින් බැහැර කිරීම හෝ ගනුදෙණු කිරීම නොකළ යුතුය.

(ඌ) ඕනෑම අවස්ථාවක ඉඩමට ඇතුල්වී පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හෝ ඔහු විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට පුළුවන.




*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(එ) බලපත්‍රය අවසන්වීමට පෙර ඉඩම සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් රජයට අවශ්‍ය වුවහොත් මසක් කල්දෙනු ලැබූ විට බලපත්‍රලාභියා විසින් එම සම්පූර්ණ ඉඩම නැතහොත් කොටස ප්‍රාදේශීය ලේකම්ට ආපසු භාරදිය යුතුය. එබදු අවස්ථාවක දී ගෙවා ඇති බදු මුදලින් ප්‍රමාණානුකූල මුදලක් ආපසු ලබා ගැනීමටත් බලපත්‍රය නොගෙවී ඇති කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු බදු මුදල අඩු කරවා ගැනීමටත් හැකියාව ඇත.

(ඒ) බලපත්‍රලාභියා විසින් කොන්දේසි කඩ කරනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා ඉඩමේ භුක්තිය වහාම ආපසු ගැනීමටත් ඇප මුදල සම්පූර්ණයෙන්ම හෝ කොටසක් රාජසන්තක කිරීමටත් ප්‍රාදේශීය ලේකම්ට අයිතිය ඇත.

(ඔ) බලපත්‍රලාභියා විසින් කරන ලද වැඩි දියුණු කිරීම් සඳහා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ රජයේ වන්දියක් ලැබීමට අයිතියක් නැත.

(ඕ) තාලවර්ගයට අයත් ඕනෑම ශාකයක් හෝ අමු කොළ සජීවී ශාක කොටස් අදාළ ඉඩමෙන් පිටතට ප්‍රවාහනය කිරීම කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ ශාඛ ආරක්ෂක පනත යටතේ තහනම් බැවින් ලෙලි සහිත පොල් මෙම ඉඩමෙන් පිටතට ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටවිල උතුර ග්‍රාම නිලධාරී වසමේ කොටවිල ගමේ පිහිටි මාතර මිනින්දෝරු අධිකාරියේ අනුරේඛන අංක එම්ආර්/ඩබ්එල්ජී 2006/235 හි කැබලි අක්ෂර ඒ වලින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 59.079ක් වන කොටස තුළ පිහිටි කනංකදෙනිය නැමති ඉඩම් කොටසේ ඵල දරන පොල් ගස් 72, තැඹිලි ගස් 09 ක ඵලදාව වර්ෂයක කාලයක් සඳහා වෙන්දේසි කිරීම.

කේ. පී. ජී. සුමිත් ශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

2016 පෙබරවාරි මස 03 වැනි දින,

02 - 669

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.